විෂය : චිත්‍ර කලාව

ශ්‍රේණිය : 12

සතිය : 06

නෙවන වාරය

සැකසුම : එම්.ඩී.ඉසුරු ධනුෂ්ක මඩපාත,
ර/අනුර මහා විද්‍යාලය, ගැටහැත්ත.

## කාර්ය පත්‍රිකාව

**නිපුණතාව : 6.0** **නිපුණතා මට්ටම : 6.5**

**පාඩම : 6.5.6. පශ්චාත් උපස්ථිතිවාදී චිත්‍ර ශිල්පීන්ගේ නිර්මාණ අධ්‍යයනය කරමු. (පෝල් සෙසාන්)**

### 01 කොටස

❖ **නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. සෙසාන් 20 වන සියවසේ ..................... ප්‍රවණතා රැසකට පදනම සැපයූ සිත්තරෙකි.

   i සනිකවාදී ii නූතනවාදී iii ප්‍රකාශනවාදී i නිර්මාණවාදී

2. ....................... චිත්‍ර කලාව තුළ සෙසාන් සිදුකළ ප්‍රධාන වෙනස් කමකි.

   i සිතුවම විකෘති කිරීම් වලින් මුදවා ගැනිම. ii සිතුවම අතිශයෝක්තියෙන් තොරව නිර්මාණය කිරීම

   iii සිතුවම ස්වභාවිකවාදිව නිර්මාණය කිරීම. iv ශාස්ත්‍රාලීය රීතිවලින් සිතුවම මුදවා ගැනිම.

3. කාඩ් සෙල්ලම් කරන්නෝ සිතුවමේ පසුබිම පැතලි ස්වරූපය අවධාරණය වන ......................... බවට පත්කර ඇත.

   i වර්ණ පදාස සමූහයක් ii ඝණ වර්ණ සමූහ iii සංගත වර්ණ iv මිශ්‍ර හා උෂ්ණ වර්ණ

4. කාඩ් සෙල්ලම් කරන්නෝ සිතුවමේ ........................... වර්ණ එකිනෙක ගැටෙන පරිදි ආසන්නව යොදා තිබේ.

   i උණුසුම් හා සංගත ii අඳුරු හා ශීත iii උණුසුම් හා අඳුරු iv අඳුරු හා විසංගත

5. කාඩ් සෙල්ලම් කරන්නෝ සිතුවම ශාස්ත්‍රාලීය යථාර්තවාදී ........................... බිඳිමින් අඳින ලද චිත්‍රයකි.

   i ත්‍රිමාණත්වය ii පර්යාවලෝකය iii අඳුර iv හැඟීම්බර බව

6. විෂය නිර්දේශයට අදාළ ඇපල් වට්ටිය සිතුවම ....................... දී නිර්මාණය කර ඇත.

   i 1859 ii 1958 iii 1895 iv 1985

7. ඇපල් වට්ටිය සිතුවම වස්තූන්ගේ .................. සහ තල අවධාරණය වන පරිදි වර්ණ ගන්වා ඇත.

   i ඝණ හා වියුක්ත හැඩ ii පැතලි හා ඝණ හැඩ iii ත්‍රිමාණ හා ජ්‍යාමිතික හැඩ iv පැතලි හා ජ්‍යාමිතික හැඩ

8. ................ තර්කවලින් මුදවා ගැනීමට දායකත්වය සැපයූ චිත්‍රයකි, ඇපල් වට්ටිය.

   i ස්වභාවිකවාදී ii ප්‍රකාශනවාදී iii නිර්මාණවාදී iv පශ්චාත් උපස්ථිතිවාදී

9. ඉරි තැළුණු බිත්ති සහිත නිවස ............... ගොඩනගා ඇත.

   i වර්ණ පදාස ක්‍රමයට ii කෙටි හා සියුම් බුරුසු පහරවලින්

   iii වේගවත් බුරුසු පහරවලින් iv කෙටි බුරුසු පහරවල් සමූහයකින්

10. ඉරි තැළුණු බිත්ති සහිත නිවස චිත්‍රය සඳහා ................ එකිනෙක ගැටෙන පරිදි දැකිය හැකිය.

i සංගත හා බහු වර්ණ ii ශීත හා උෂ්ණ වර්ණ iii මිශ්‍ර වර්ණ iv ශීත වර්ණ පමණක්

11. ඉරි තැළුණු බිත්ති සහිත නිවසේ වහළයේ ................ චිත්‍රයේ සිත් ඇදගන්නා වඩාත් ප්‍රබල සීමාවකි.

i රත් පැහැ දාර ii ගුරු වර්ණ රේඛා iii දීප්තිමත් සීමාව iv උණුසුම් වර්ණ දාර

12. ඉරි තැළුණු බිත්ති සහිත නිවස චිත්‍රයේ, බොහෝ විට ................ ස්වරූපයෙන් අරමුණු ග්‍රහණය කරගෙන තිබේ.

i ත්‍රිමාණී ii ඝණ iii ද්විමානී iv තාත්වික

13. රූපවල ................ කෙරෙහි විශේෂ සැලකිල්ලක් දක්වා තිබේ.

i ආකෘතිය හා වස්තු විෂය ii ආකෘතිය හා පරිමාණය iii ආකෘතිය හා වර්ණ iv ආකෘතිය හා හැඩ

❖ **පහත ප්‍රශ්න අංක 14 සිට 22 දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.**

14. අප සියල්ලන්ගේම පීතෘවරයා සෙසාන් යැයි ප්‍රකාශ කළේ කවුද ? ....................................................................

15. සෙසාන් චිත්‍ර කලාව තුළ සිදුකළ වෙනස්කම් 04ක් ලියන්න.

i ........................................................................................ ii ........................................................................................

iii ..................................................................................... iv .....................................................................................

16. "කාඩ් සෙල්ලම් කරන්නෝ" චිත්‍රයෙන් නිරූපණය වන්නේ මොනවාද ? ..........................................................

.....................................................................................................................................................................

17. චිත්‍ර නිර්මාණයේ දී සෙසාන් විසින් භාවිත කළ ප්‍රකට උපක්‍රමය කුමක්ද ? ..................................................

.....................................................................................................................................................................

18. කාඩ් සෙල්ලම් කරන්නෝ චිත්‍රයේ සමබරතාවය ආරක්ෂා කිරීමට සෙසාන් අනුගමනය කළ ශිල්ප ක්‍රමය කුමක්ද ? .....................................................................................................................................

.....................................................................................................................................................................

19. "ඇපල් වට්ටිය" චිත්‍රයේ දැකිය හැකි මූලික දෘශ්‍ය අරමුණු මොනවාද ?

.....................................................................................................................................................................

20. ඇස් දෙකෙන් ම වස්තු නිරීක්ෂණයේ දී ගෝචර වන ද්විගුණ දෘෂ්ටියට අනුව පර්යාවලෝකය ගොඩ නගා ඇති බවට ඇපල් වට්ටිය සිතුවමෙන් උදාහරණයක් දක්වන්න.

.....................................................................................................................................................................

21. "ඉරිතැළුණු බිත්ති සහිත නිවස" චිත්‍රයෙන් නිරූපණය වන්නේ මොනවාද ? ..................................................

.....................................................................................................................................................................

22. ඉරිතැළුණු බිත්ති සහිත නිවස චිත්‍රයෙන් දැකිය හැකි සෙසාන්ගේ වර්ණ කිරීමේ ක්‍රමය හා භාවිත කළ වර්ණ ගැන කුමක් කිව හැකිද ? .........................................................................................................

.....................................................................................................................................................................

## <u>02 කොටස</u>

❖ **පහත දැක්වෙන ප්‍රශ්න සඳහා ව්‍යුහගත පිළිතුරු සපයන්න.**

1. පෝල් සෙසාන් උපස්ථිතිවාදී කලා ව්‍යාපාරයෙහි ඇතිකළ නව පරිවර්තන මොනවාදැයි ලැයිස්තුවක් සකස් කරන්න.
2. පෝල් සෙසාන්ගේ සිතුවම් පිළිබඳ ඇගයීමක් කරන්න.